# යකුන්ට බුදුන් හමුවීම


## උවිඳු කුරුකුලසූරිය


'මේක බුදුන් වැඩිය රට'යයි අතිගරු ජනාධිපති තුමා රැස්වීමකදී කියූ වග එතුමාගේ කට හඬින්ම පෙරේදා සිරස ප්‍රවෘත්ති තුළින් දුටිමි. මගේ අම්මා ද, ආච්චි අම්මා ද, ආච්චි අම්මාගේ අම්මා ද අපේ රටට බුදුන් වැඩි බව කියා ඇත. එහෙත් රටේ රාජ්‍ය නායකයකු ඒ බව කියනු ප්‍රථම වරට ඇසුවේ අතිගරු ජනාධිපති තුමාගේ කටහඬිනි. එතුමාණෝ අර්ථයක් නොමැතිව වචනයක් වත් පිට නොකරති. අපට ඇත්තේ එතුමාණන්ගේ කටින් පිට වන වචන වල අර්ථ සෙවීමය.

දීපවංශය අනුව යකුන් දිවයිනේ මුල් පදිංචි කරුවන්ය. (ධර්මපාල තුමා 1908 දී කියූ පරිදි ඉන්දියාවෙන් මෙරටට සිංහලයන් පැමිණීමට පෙර මෙරට වාසය කළේ ආර්ය නොවන ද්‍රවිඩ වර්ගයකි. ඔවුන් යක්‍ෂ ලෙස හැඳින්වීය.) බුදුන්ගේ ප්‍රථම ගමනේදී යක්කු මහියංගනයට රැස්වූහ. අහසෙහි වැඩ සිටි බුදුහු වැස්සෙන් හා සීත සුළඟින් මේ පිරිස පීඩාවට පත් කළහ. උන් වහන්සේ ඔවුන්ට කතා කරමින් මේ විපත ඉවත් කරවීමට නම් තමනට වැඩ සිටීමට තැනක් දෙන ලෙස කියා සිටියහ. ඊට එකඟ වූ යක්කු සීතලෙන් මිදීමට උණුසුම සපයන ලෙස ආයාචනා කළහ. එවිට බුදුහු තමන් වැඩ සිටි පලසින් ඉසිලිය නොහෙන රශ්මියක් විහිදුවමින් යකුන්ට පලා යාමට බල කළහ.

ඊට වෙනස් ලෙස මහාවංශයේ එන විස්තරයට අනුව යකුන්ට එම අවස්ථාවේදී උපකාර වූ නිසා ඔවුහු මුළු ලංකාද්වීපයම බුදුන්ට පිදූහ. එහිදී බුදුන් වැඩ සිටි පලස ගිනි ගෙන පුළුල් වීමත් සමඟ පලා ගොස් වෙරළට රැස්වූ යකුන් දීපවංශයේ දැක්වෙන අයුරින්ම ඉවතට යැවුණි.

වම්සත්ථප්පකාසිනියේ ඒ මුණ ගැසීම වඩාත් විචිත්‍රව දැක්වෙයි. යකුන් බුදුන් පිළිසරණ පැතූ අතර උන් වහන්සේ තමන්ට වැඩ සිටීමට ස්ථානයක් ඉල්ලා සිටියහ. යකුන් මුළු දිවයිනම උන්වහන්සේට පූජා කළහ. මෙය පසුව කඩකරනු ඇතැයි බුදුහු සැක පළ කළහ. යක්කු දිවයිනේ අයිතිය බුදුන්ට අත්වීම පිළිබඳව කිසි විටෙකත් බාධා නොකරන බවට දිවුරුම් දුන්හ. බුදුහු පලස පිට වැඩ සිට ඔවුන් පෙලූ සීතල හැර අන් තත්ත්වයන් සාමාන්‍ය බවට පත් කළහ. යක්ෂයෝ හිරුගේ රැස් නිදහස් කරන ලෙස අයැද සිටියහ. ඒ අනුව බුදුන් විසින් සිය පලසින් රශ්මිය නිකුත් කරනු ලැබීය. ඒ පළස පළල් වී මුළු දිවයිනම වසා ගති. එවිට බුදුන්ගේ සිරුරද ප්‍රසාරණය වූ අතර අන්තිමේ දී පලසේ පලලත් බුදුන්ගේ සිරුරේ හා දිවයිනේ ප්‍රමාණයත් එකම විය. ප්‍රසාරණය වූ පලස අනුව වෙරළට රැස්වූ යක්ෂයෝ දේවාතිදේව වූ මේ බලවතා දිවයින හිමිකරගත් බවත් එයට තම අයිතිවාසිකම් නැති බවත් පිළිගත්හ. ඔවුන්ගේ මේ තත්ත්වය නිසා බුදුන්ගේ කරුණාව පහල වී වංශ කතා කියන පරිදි යක්කුන්ට සංක්‍රමණය වීමට ගිරිද්වීපත ලඟා කරන ලදී.

බුදුන්ට යකුන් මුණ ගැසීම. මේ කතාවේ ඉහත සඳහන් වාර්තා තුන සහ ත්‍රිපිටකයේ අමනුෂ්‍යයන් දමනය කිරීම පිළිබඳ විස්තර අතර තියුණු වෙනසක් තිබේ. ආලවක (ඔහුද යකෙකි.) දමනයේදී තමන් වෙත එල්ල වූ දැඩි විරෝධයට නොසැලී කරුණාවෙන් ඉවසීමෙන් හා දයාවෙන් බුදුන් ආලවක දිනා ගති. එහෙත් ලංකා ගමනේ කතාවල බුදුන් සිත්තම් කර ඇත්තේ පීඩාකාරී ක්‍රම තුළින් යකුන්ට අවහිර කළ අයෙකු ලෙසය. උන්වහන්සේ යකුන්ගෙන් තමන්ට වැඩසිටීමට තැනක් ඉල්ලූ අතර අන්තිමේදී ඔවුන් තම මව්බිමෙන්ද පලවා හරින ලදී.

මේ පුරාවෘත අනුව බුදුන්ද ජයග්‍රාහකයෙකි. උන් වහන්සේ යකුන්ට එරෙහිව යෙදූ අධිමානුෂික බලවේග රජුන්ගේ සතුරන්ට විරුද්ධව යොදන ප්‍රචණ්ඩ ක්‍රියාවලට සමාන කළ හැක. බුදුන් එවැනි අසාමාන්‍ය පියවරක් ගැනීම යුක්ති යුක්ත කිරීම සඳහා දක්වා ඇත්තේ යකුන් සත්‍ය තේරුම් ගැනීමට අසමත්වූ නිසාත් ශාසනයට විරුද්ධ වූ නිසාත් දිවයිනෙන් පළවා හැරීමට සිදුවූවක් ලෙසිනි. එහෙයින් පුරාවෘතයෙන් කියැ වෙන්නේ පාලි ත්‍රිපිටකයේ අඩංගු සදාචාර මූලධර්මයන්ට වඩා වෙනස් එකකි. එනම් ශාසනයේ සුභ සිද්ධිය සඳහා සත්‍ය ධර්මය අවබෝධ කරගත නොහැකි අයට හා ඊට විරුද්ධ වන අයට එරෙහිව ප්‍රචණ්ඩ ක්‍රියාවල යෙදීම යුක්ති සහගත බවය. ප්‍රචණ්ඩ ක්‍රියාකෙරෙහි ආකල්පය මෙසේ අලුතෙන් අර්ථ නිරූපනය කිරීමෙන් සදාචාරාත්මක පරමාදර්ශය හා රජුන්ගේ ප්‍රායෝගික හැසිරීම පිළිබඳ ප්‍රතිවිරෝධය සමනය කිරීම පහසු වෙයි.

පසු සටහන :

මහාචාර්ය සෙනරත් පරණවිතානයන්ගේ සිට මේ දක්වා කිසිදු ඉතිහාසඥයකු බුදුන් ලංකාවට වැඩි බව සනාථ කර නැත. පරණවිතාන නම් 1972 දී එය ප්‍රතික්ෂේප කළේය. එසේ නම් බුදුන් ලංකාවට වැඩි බව කියන්නේ ඇයි දැයි තව දුරටත් පසුව විමසා බලමු.